# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1113/15 - 2000 ජනවාරි 05 වැනි බදාදා - 2000.01.05

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ දැන්වීම්

එල්. ඩී. බී. 5/83.

**1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනත**

1994 අංක 06 දරන පනතින් සංශෝධිත 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 26 වන වගන්තිය යටතේ කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යවරයා විසින් සාදනු ලද නියෝග.

ඩී. මු. ජයරත්න,
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍ය.

1999 නොවැම්බර් මස 24 වැනි දින.

**නියෝග**

01. මෙම නියෝග 1999 අංක 1 දරන පළිබෝධනාශක පාලන කිරීමේ (විකිණීමේ හා සැපයීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. පළිබෝධනාශක හා ඒවා අලෙවි කිරීමේ ක්‍රම හා විධි පිළිබඳ පුහුණු පාඨමාලාවක් හැදෑරීමෙන් පසු, පළිබෝධනාශක පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා වෙතින් හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් බලය පවරනු ලැබූ යම් නිලධරයකු වෙතින් හෝ ඒ වෙනුවෙන් සහතිකයක් ලබාගත් යම් තැනැත්තකු මිස, වෙනත් කිසිම තැනැත්තකු විසින් යම් සාමාන්‍ය හෝ සීමිත පළිබෝධනාශකයක් විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම නොකළ යුතුය.

03. සාමාන්‍ය හෝ සීමිත යම් පළිබෝධනාශකයක් විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලබන යම් තැනැත්තකු විසින් -

(අ) තමා භාරයේ ඇති පළිබෝධනාශක තොග පිළිබඳ වාර්තාවක්,

(ආ) එම පළිබෝධනාශක මිලට අලෙවි කරනු ලැබූ තැනැත්තන් වෙතින් ඔහු ලබාගත් සියලුම ලදුපත්

මෙහි උපලේඛනයේ දක්වා ඇති (I) වන ආකෘතිය ප්‍රකාරව පවත්වාගෙන යා යුතු ය.

04. සාමාන්‍ය හෝ සීමිත යම් පළිබෝධනාශකයක් විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලබන යම් තැනැත්තකු විසින්, එවැනි යම් පළිබෝධනාශකයක් විකිණීම සම්බන්ධයෙන් මෙහි උපලේඛනයේ දක්වා ඇති (II) ආකෘතිය ප්‍රකාරව එම පළිබෝධනාශකය පිළිබඳ විස්තර ලබා දෙන්නා වූ ලදුපතක් නිකුත් කළ යුතු ය.

05. කිසිම තැනැත්තකු විසින් සාමාන්‍ය හෝ සීමිත යම් පළිබෝධනාශකයක් වයස අවුරුදු දහ අටෙන් පහළ යම් තැනැත්තකුට විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම නොකළ යුතු ය.


1A-PG 000086-900 20(00/01)

06\. (අ) යම් සාමාන්‍ය හෝ සීමිත පළිබෝධනාශකයක් විකුණන හෝ විකිණීම සඳහා ඉදිරිපත් කරන සෑම තැනැත්තකුම ඒ පළිබෝධනාශකය එවැනි පළිබෝධනාශක තැබීමේ කාර්යය සඳහා ම පමණක් පාවිච්චි කරන වෙනම ගොඩනැගිල්ලක තබාගත යුතු ය.

එසේ වුව ද ගොඩනැගිල්ල හෝ ගොඩනැගිල්ලේ කොටස, වාත පාරගම්‍යතාවෙන් තොර බවට සහ ආහාර හා වෙනත් වෙළඳ ද්‍රව්‍ය දූෂණය වීම වැළැක්වීම පිණිස, පළිබෝධනාශක, ආහාර හා වෙනත් වෙළඳ ද්‍රව්‍ය විකුණන ස්ථානයෙන් වෙන් කොට තබා ඇති බවට වගබලාගැනීම පිණිස, යම් තැනැත්තකු විසින් සියලු නිසි ක්‍රියා මාර්ග ගෙන ඇත්තා වූ අවස්ථාවක, ඒ තැනැත්තා විසින්, යම් සාමාන්‍ය හෝ සීමිත පළිබෝධනාශකයක්, ආහාර හෝ වෙනත් වෙළඳ ද්‍රව්‍යයක් සමඟ එකම ගොඩනැගිල්ලක තබා විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම කළ හැකි ය.

(ආ) යම් සාමාන්‍ය හෝ සීමිත පළිබෝධනාශකයක් විකුණන හෝ විකිණීම සඳහා ඉදිරිපත් කරන සෑම තැනැත්තකු ම, ක්ෂේත්‍රයෙහි පළිබෝධනාශක යෙදීමේ දී සාමාන්‍ය හෝ සීමිත පළිබෝධනාශක ආරක්ෂා සහිතව පාවිච්චි කරන බවට වගබලා ගැනීම පිණිස අවශ්‍ය විය හැකි සියලු ආරක්ෂක ඇඳුම් විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම කළ යුතු ය.

## උපලේඛනය

### I වන ආකෘතිය

(තොග වාර්තා නඩත්තු ලේඛනය)

නිෂ්පාදන විස්තරය : (නිෂ්පාදනයේ වෙළඳ නාමය හා ඇසුරුමේ ප්‍රමාණය)

| දිනය | ලැබීම් හා නිකුත් කිරීම් | කල් ඉකුත් වන දිනය | ලැබූ ප්‍රමාණය | දෛනික නිකුත් කිරීම | ශේෂය |
|---|---|---|---|---|---|
| | (ලැබූ නිෂ්පාදන සඳහා) සැපයුම්කරුගේ නම හා ලදුපත් අංකය සහ (නිකුත් කිරීම් සඳහා) අදාළ මුදල් ලදුපත්වල අංක | අදාළ කාණ්ඩයේ කල් ඉකුත් වන දිනය | | | |

### II වන ආකෘතිය

(මුදල් ලදුපත්)

වෙළඳ සැලේ සම්පූර්ණ නම හා ලිපිනය :

වෙළඳ බලපත් අංකය : (පළාත් පාලන ආයතනය විසින් නිකුත් කළ)

වෙළඳ සහතිකයේ අංකය : (ප්‍රදේශයේ බලයලත් නිලධාරියා විසින් නිකුත් කළ)

මිලදී ගත් තැනැත්තාගේ නම :

ලිපිනය :

| කාණ්ඩ අංකය | ප්‍රමාණය | වෙළඳ නාමය | ඒකක මිල | මිල |
|---|---|---|---|---|
| | | | | |

01-229

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.